සැ. යු. - මෙම ගැසට් පත්‍රයේ දෙමළ අනුවාදය වෙනම මුද්‍රණය කෙරේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,717 - 2011 ජූලි මස 29 වැනි සිකුරාදා - 2011.07.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )

| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | 1026 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 1032 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |

| | පිටුව |
|---|---|
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | — |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ***ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2011 අගෝස්තු මස 05 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2011 ජූලි මස 22 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2011 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු — ඇබෑර්තු

## මඩකලපුව මහ නගර සභාව

### නැගෙනහිර රාජ්‍ය සේවයේ ඇති පුරප්පාඩු පිරවීම

මඩකලපුව මහ නගර සභාවේ දැනට පුරප්පාඩුව පවතින පහත වගුවේ සඳහන් රැකියාව සඳහා බඳවාගැනීමට අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කළ නැගෙනහිර පළාත තුල ස්ථිරව පදිංචි වී සිටින අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලබයි. (මඩකලපුව මහ නගර සභා බල ප්‍රදේශය තුල ස්ථිරව පදිංචි වී සිටින අයදුම්කරුවන්ට හා මඩකලපුව මහ නගර සභාවේ දැනට අනියම් ආදේශක සේවකයන් වශයෙන් කොන්ත්‍රාත් පදනමෙන් සේවය කරන අයදුම්කරුවන්ට ප්‍රමුඛතාවය ලබාදෙනු ලැබේ :-

| *අනු. අංකය* | *රැකියාව* | *පුරප්පාඩු සංඛ්‍යාව* | *වැටුප් පරිමාණය* | *අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම්* |
|---|---|---|---|---|
| 01 | දුරකථන ක්‍රියාකරවන්නා | 01 | පීඑල් 1- 2006A<br>රු.13,060-19x130<br>රු.14,880 | දෙවතාවකට නොඅඩු වාරයකින් අ. පො. ස. (සා. පෙ.) විභාගයෙන් හෝ ජාතික අධ්‍යාපන සහතික පත්‍ර විභාග යෙන් මව් භාෂාව ඇතුලුව අවම වශයෙන් විෂයයන් හයකින් (06) සමත්ව තිබීම |

02. *බඳවා ගැනීමේ පොදු කොන්දේසි*

1. ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.
2. අයදුම්පත් භාරගන්නා අවසාන දිනයට, අවුරුදු තුනකට වැඩි කාලයක් නැගෙනහිර පළාතේ ස්ථිර පදිංචිකරුවකුව සිටිය යුතුය.
3. අයදුම්කරුවන් යහපත් සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත අය විය යුතුය.
4. සේවා අවශ්‍යතා මත ක්‍රමවත් සම්මුඛ පරීක්ෂණයකින් සුදුසු අයදුම්කරුවන් තෝරාගනු ලැබේ.
5. සිවිල් නීතිය යටතේ අධිකරණයක දී වරදකරුවකු හෝ රාජ්‍ය හා පළාත් සේවයක සිට සේවයෙන් ඉවත් කළ අයකු නොවී සිටීම.

03. *වයස් සීමාව* .- අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා 45ට නොවැඩි අයෙකුවීම. දැනට රාජ්‍ය හෝ පළාත් සේවයේ නියැලෙන අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව සලකනු නොලැබේ.

04.1. මෙම පත්වීම ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතයි.
2. පත්වීම අවුරුදු තුනක පරිවාස කාලයට යටත් වේ.
3. ඒ ඒ පදවියන් සඳහා තෝරාගත් කොන්දේසිවලට අමතරව ආයතන සංග්‍රහයේ නීති රීති, මුදල් රෙගුලාසි හා නැගෙනහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ රීතිවලට සහ දෙපාර්තමේන්තු රෙගුලාසිවලට යටත්ව සේවය කිරීමට බැඳී සිටිය යුතුයි.

05. *අයදුම් කළ යුතු ආකාරය ඃ*

1. මෙම දැන්වීමේ පහත සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුව (ඒ4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්තම භාවිතාකරමින්) සකස්කරන ලද අයදුම්පතක් සම්පූර්ණ කොට, මහ නගර සභා කොමසාරිස්, මඩකලපුව මහ නගර සභාව, මඩකලපුව යන ලිපිනයට 2011.07.30 වැනි දිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතුයි.
2. අයදුම්පත්‍රය බහා එවන ලියුම් කවරයේ වම්පස ඉහල කෙළවරේ '.............. තනතුර සඳහා අයදුම් පත්‍රය' යනුවෙන් සඳහන් කොට එවිය යුතුයි.
3. දැනට රාජ්‍ය/පළාත් සේවයේ නිරත අයදුම්කරුවන් තම අයදුම්පත ආයතන ප්‍රධානීන් හරහා එවිය යුතුයි.
4. අදාල දිනට ප්‍රමාදවී ලැබෙන අයදුම්පත්‍ර සලකා බලනු නොලැබේ.
5. අයදුම්පත් සමග පහත සඳහන් සහතිකපත්‍රවල සහතික කළ පිටපත් අමුණා එවිය යුතුයි. සහතික පත්‍රවල මුල් පිටපත් පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතුයි ඃ-

(i) උප්පැන්න සහතිකය ;
(ii) අධ්‍යාපන සහතික පත්‍ර ;
(iii) ස්ථිර පදිංචිය සනාථකරන ග්‍රාම නිලධාරිගේ සහතිකය ;
(iv) මෑතක දී ලබාගත් චරිත සහතික දෙකක් ;
(v) වෘත්තීය සුදුසුකම් දක්වන සහතිකපත් ;
(vi) තනතුරට අදාල පළපුරුද්ද සඳහා සහතිකපත්‍ර .

ක. සිවනාදන්,
මහ නගර සභා කොමසාරිස්,
මහ නගර සභාව,
මඩකලපුව.

මහ නගර සභා කාර්යාලය,
මඩකලපුව.
2011 ජුනි මස 30 වැනි දින.

**ආදර්ශ අයදුම්පත්‍රය**

*මඩකලපුව මහ නගර සභාව*

*....................................................................... තනතුර සඳහා ආදර්ශ අයදුම්පත්‍රය*

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම :————————————.
2. මුලකුරු සමග නම :————————————.
3. ස්ථිර පදිංචි ලිපිනය :————————————.
4. උපන් දිනය :
 වර්ෂය:————————. මාසය:————————————. දිනය:————————————.
5. අයදුම්පත්‍ර භාරගන්නා අවසන් දිනට වයස:
 අවුරුදු:————————————. මාස:————————————. දින:————————————.
6. ස්ත්‍රී/පුරුෂ භාවය:————————————.
7. විවාහක/අවිවාහක බව:————————————.
8. ජාතිය හා ආගම:————————————.
9. ඔබ ශ්‍රී ලාංකික පුරවැසියෙක් ද? එසේනම් උපතින් ද, ලියාපදිංචියෙන් ද?:————————————.
10. මහ නගර සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචි කාලය:————————————.
11. අධ්‍යාපන සුදුසුකම් (සහතිකවල පිටත් අමුණා එවිය යුතුයි):————————————.
12. වෙනත් සුදුසුකම්:————————————.
13. පළපුරුද්ද සහ වෘත්තීය සුදුසුකම්:————————————.
14. ඔබ දැනට මෙම සභාවේ සේවය කරන්නේනම්, සේවා කාලය, සේවා විස්තරය හා තනතුරේ ස්වභාවය:————————————.
 (අනියම්, ස්ථිර නොවන, ආදේශක, ගිවිසුම් මත පදනම් වූ)
15. ඔබට කුමන හෝ වරදකට අධිකරණයකින් දඬුවම්කර තිබේ ද?:————————————.

මා විසින් මෙම අයදුම්පත්‍රයේ සඳහන් කර ඇති තොරතුරු සියල්ල සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. එහි යම් කිසි තොරතුරක් අසත්‍ය හෝ වැරදි බවට, තනතුරට පත්කිරීමට පෙර ඔප්පුවුවහොත් මා තනතුරට නුසුදුසුවන බව ද, තනතුරට පත්වීමෙන් පසුව ඔප්පුවුවහොත් කිසිදු වන්දි මුදලක් නොගෙවා තනතුරෙන් ඉවත් කරනු ලබන බව ද දනිමි.

————————————.
අයදුම්කරුගේ අත්සන.

දිනය :————————————.

*ආයතන ප්‍රධානියාගේ සහතිකය ඃ*
*(දැනට සේවයක නිරතවූවන් සඳහා)*

අයදුම්කරුගේ ඉහත තොරතුරු සත්‍ය බවත්, තනතුරට බඳවාගනු ලැබුවහොත් ඔහු නිදහස් කළ හැකි බව ද, ඔහු ...................... වශයෙන් සේවය කරන බවද සහතික කරමි.

————————————.
ආයතන ප්‍රධානියාගේ අත්සන.

දිනය :————————————.

07-635

---

**කුලියාපිටිය නගර සභාව**

වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ කුලියාපිටිය නගර සභාවේ ප්‍රාථමික ශිල්පීය නොවන, සේවා ගණයෙහි පුරප්පාඩු වී ඇති මෙහි පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා නියමිත සුදුසුකම්ලත් අයවලුන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. *ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණය ඃ-*

| 1.1 | *තනතුරු නාමය* | *තනතුරු ගණන* | *මාසික වැටුප් පරිමාණය* |
|---|---|---|---|
| | සෞඛ්‍ය කම්කරු | 03 | රු. 11730-10 x 120-10 x 130 - |
| | මාර්ග කම්කරු | 01 | 10 x145 - 12 x 160 - රු. 17,600 |

1.2 *අධ්‍යාපන සුදුසුකම් ඃ*

(*අ*) අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී යටත් පිරිසෙයින් විෂයයන් දෙකක්වත් සමත් වී තිබිය යුතුයි.

(ආ) සෞඛ්‍ය කම්කරුවන් බඳවා ගැනීමේ දී අවම අධ්‍යාපන සුදුසුකම වනුයේ රජය විසින් අනුමත කරන ලද පාසලකින් 8 ශ්‍රේණිය (9 වසර) සමත් වී තිබීමය.

(ඇ) මෙම බඳවා ගැනීමේ පටිපාටිය ක්‍රියාත්මක වන විට ප්‍රාථමික ශිල්පීය නොවන තනතුරු සඳහා අනියම්/ආදේශක/කොන්ත්‍රාත් පදනමින් බඳවා ගෙන ඇති සේවකයින්ට පමණක් පෞද්ගලික වන සේ එවකට පැවැති බඳවා ගැනීමේ පටිපාටියේ අධ්‍යාපන සුදුසුකම් අදාළ වේ.

*සංලක්ෂ්‍යය :*

මෙම සේවා ගණය සඳහා බඳවා ගනු ලබන්නන් සම්බන්ධයෙන් තනතුරු නාමය සඳහන් කරනුයේ හුදෙක්ම අවස්ථානුකූලව කාර්යයන් පැවරීම සඳහා වන අතර, පත්වීම් බලධාරියා/දෙපාර්තමේන්තු ප්‍රධානියා/ආයතන ප්‍රධානියා විසින් සේවා ගණය යටතේ වූ කවර සේවකයෙකුට වුව ද තනතුරු උපලේඛනයේ සඳහන් තනතුරු නාමයන් අතරින් ඕනෑම එකක් සහ කාර්යයන් අතරින් ඕනෑම කාර්යයක් පවරනු ලැබිය හැක. තනතුරු නාමය කුමක් වුව ද ඒ සියලුම සේවකයින් එකම සේවා ගණයට අයත් සමාන තත්ත්වයේ වූවන් ලෙස සැලකේ.

*1.3 වයස :*

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි අය විය යුතුයි. දැනටමත් කුලියාපිටිය නගර සභාවේ ස්ථිර තනතුරක නියුතු අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපැවැත්වේ.

*02. පොදු කොන්දේසි :*

01. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයට පූර්වාසන්න වසර තුනක් කුලියාපිටිය නගර සභා බල ප්‍රදේශය තුල ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුයි. පදිංචි වසමේ ග්‍රාම නිලධාරි විසින් නිකුත් කරනු ලබන සහතිකයක් මත අදාල ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කර සනාථ කර තිබිය යුතුයි.
02. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුයි.
03. යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්වයෙන් යුක්ත විය යුතුයි.
04. දැනටමත් පළාත් සභා රාජ්‍ය සේවයේ නියුතු අයකු නම් ඔහු අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 5ක් තුළ අවවාද කිරීමක් හැර දඬුවම් ලබා නොතිබිය යුතු අතර, එකී පූර්වාසන්න වසර 5 තුළ සියලු වැටුප් වර්ධක උපයාගෙන තිබිය යුතුයි.
05. දැනට කුලියාපිටිය නගර සභාවේ සේවයේ නියුතු අනියම්/ආදේශක/කොන්ත්‍රාත් පදනමින් බඳවාගෙන ඇති සේවකයින්ට පමණක් පෞද්ගලික වනසේ එවකට පැවැති බඳවා ගැනීමේ පටිපාටියේ අධ්‍යාපන සුදුසුකම් අදාල වේ.
06. මෙම තනතුරු පත් කිරීම සඳහා වන බඳවා ගැනීමේ පරීක්ෂණයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ අයදුම්කරු ඉහත සුදුසුකම් අයදුම්පත් භාර ගන්නා අවසාන දින වන විට සෑම ආකාරයකින්ම සපුරා ඇත්නම් පමණි.
07. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිත ය. වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුපට දායක විය යුතු ය.
08. තෝරා ගනු ලබන්නන් අවුරුදු 3ක පරිවාස කාලයකට යටත් වේ.
09. දැනටමත් මේ නගර සභාවේ අදාල තනතුරුවල තාවකාලික/අනියම්/ආදේශක පදනම මත සේවයේ නියුක්ත වූවන්ට වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

*03. බඳවා ගැනීමේ ක්‍රමය හා අයදුම්පත් ඉදිරිපත් කිරීම :*

01. ශිල්පීය නොවන තනතුරු සඳහා අයදුම්පත් කැඳවීමෙන් පසු ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත අපේක්ෂකයින් බඳවා ගැනේ.
02. අයදුම්පත් සමග පහත සඳහන් සහතිකවල ඡායා පිටපත් අමුණා එවිය යුතුය.
    - (අ) උප්පැන්න සහතිකය ;
    - (ආ) අධ්‍යාපන සහතික ;
    - (ඇ) පදිංචිය සනාථ කිරීම පිණිස ප්‍රාදේශීය ලේකම්වරයාගේ සහතිකය;
    - (ඈ) මෑතකදී ලබා ගත් චරිත සහතික 02ක්;
    - (ඉ) වෘත්තීය/පළපුරුද්ද පිළිබඳ සහතික;
03. එක් අයදුම්කරුවෙකුට එක් තනතුරකට වඩා ඉල්ලුම් කළ හැකි අතර එක් එක් තනතුර සඳහා වෙන වෙනම අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.
04. අයදුම්කරුවන් මෙහි පහත දක්වා ඇති ආදර්ශ අයදුම්පත අනුව පිළියෙල කරන ලද අයදුම්පත් 2011.08.29 දින හෝ ඊට පෙර ලැබෙන සේ ''ලේකම්, කුලියාපිටිය නගර සභාව, කුලියාපිටිය'' යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.
05. අයදුම්පත බහාලන කවරයේ වම් පස ඉහල කෙළවරේ අදාළ තනතුර සඳහන් කළ යුතුය.
06. මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පමණක් යථා කාලයේ දී සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.
07. මෙම අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ ඒ අතරතුර හෝ බඳවා ගැනීම ප්‍රමාද කිරීමේ හෝ මෙම නිවේදනය අවලංගු කිරීමේ බලතල මා සතුය.

එස්. ජේ. එස්. වනසිංහආරච්චි,
ලේකම්,
නගර සභාව, කුලියාපිටිය.

2011 ජූලි මස 11 වැනි දින,
කුලියාපිටිය නගර සභා කාර්යාලයේ දී ය.

*ආදර්ශ අයදුම්පත*

කුලියාපිටිය නගර සභාවේ .............................................................................. තනතුර සඳහා වූ අයදුම්පත්‍රය

01. (අ) මුලකුරු සමග නම :————————.
(ආ) සම්පූර්ණ නම:————————.
02. ලිපිනය :————————.
03. (අ) උපන්දිනය: අවුරුද්ද:————. මාසය:————. දිනය:————.
(ආ) 2011:————.දිනට වයස අවු. :————.මාස:————. දින:————.
04. උපන් ස්ථානය:————————.
05. දැනට පදිංචි ස්ථානය හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය:————————.
06. ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් ද:————————.
07. ස්ත්‍රී/පුරුෂ භාවය:————————.
08. විවාහක/අවිවාහක බව:————————.
09. සමත් වී ඇති ඉහලම විභාගය:————————.
10. වෙනත් අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්:————————.
11. මීට පෙර රජය යටතේ හෝ සංස්ථාවක හෝ සේවයේ යෙදී සිටියේ නම් ඉන් අස්වීමට හේතු :————————.
12. (අ) උසාවියක් මගින් ඔබට දඬුවම් කොට ඇත්තේ ද:————————.
(ආ) එසේ නම් දඬුවමේ ස්වභාවය:————————.
13. චරිත සහතික ලබා ගත් තැනැත්තන් දෙදෙනෙකුගේ නම් ලිපිනයන් හා ස්ථිර පදිංචිය සඳහන් කරන්න
(1) :————————. (2) :————————.
14. දැනට කුලියාපිටිය නගර සභාවේ සේවයේ යෙදී සිටින්නේ නම් ඒ පිළිබඳ විස්තර :————————.

මෙම ඉල්ලුම්පත්‍රයෙහි මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය වූත් නිවැරදි වූත් ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුලත් තොරතුරු අසත්‍ය බව මා මෙම තනතුරට තොරා ගැනීමෙන් පසු අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් දනිමි.

————————.
අයදුම්කරුගේ අත්සන.

දිනය:————————.

*දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ සහතිකය (දැනට සේවයේ නියුක්ත වූවන් සඳහා පමණි) :*

අයදුම්කරු ඉහතින් දක්වා ඇති තොරතුරු නිවැරදි බවත් තෝරාගනු ලැබුවහොත් සේවයෙන් මුදාහැරීමට එකඟ වන බවත් දැනට ..................................................වශයෙන් සේවය කරන බවත් සහතික කරමි.

————————.
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන.

දිනය :————————.

07-754

---

## වත්තල ප්‍රාදේශීය සභාව

වත්තල ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩුව පවතින මෙම නිවේදනයේ සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා සුදුසුකම් ඇති බස්නාහිර පළාත තුල ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය* | *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|---|
| 01 | ආදායම් පරිපාලක II ශ්‍රේණිය | 01 | රු.12,940-12x120-11x140-10 x 210 10 x 290-රු.20,660 | ජ්‍යෙෂ්ඨ පාඨමාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ අ.පො.ස.(සා.පෙ.) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී අංක ගණිතය/ගණිතය/ වානිජ අංක ගණිතය/ශුද්ධ ගණිතය සහ සිංහල/දෙමළ භාෂාව ඇතුළුව විෂයයන් හයකින් (06) සාමාර්ථය ලබා තිබීම හා බස්නාහිර පළාත තුල |

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය* | *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|---|
| | | | | පළාත් පාලන ආයතනයක වසර (05ක සේවා කාලයක් සහිත ස්ථිර තනතුරක් දරන්නෙකු වීම<br>හෝ<br>ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ අ.පො.ස.(සා.පෙ.) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී අංක ගණිතය/ගණිතය/ වානිජ අංක ගණිතය/ශුද්ධ ගණිතය සහ සිංහල/දෙමළ භාෂාව ඇතුළුව විෂයයන් පහකට (05) සම්මාන සාමාර්ථ සහිතව විෂයන් හයකින් (06) සාමාර්ථය ලබා තිබීම |
| 02. | කර්මාන්ත පරිපාලන II ශ්‍රේණිය (මාර්ග සුළු පරිපාලන) | 01 | 12,940-12x120-11x140-10 x 210 10 x 290-20,660 | ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ අ.පො.ස.(සා.පෙ.) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී අංක ගණිතය/ ගණිතය/වානිජ අංක ගණිතය/ශුද්ධ ගණිතය සහ සිංහල/දෙමල භාෂාව ඇතුළුව විෂයයන් 06කින් සාමාර්ථය ලබා තිබීම.<br>හෝ<br>ජාතික අධ්‍යයන පොදු සහතික පත්‍ර විභාගයෙන් එකම වතාවක දී ගණිතය සහ සිංහල/දෙමළ භාෂාව ඇතුළුව විෂයන් හයකින් (06)සාමාර්ථය ලබා තිබීම<br>හෝ<br>පළාත් පාලන ආයතනයක අවු. 10කට නොඅඩු අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කර ඇත්නම් 8 වැනි පන්තිය සමත් වී තිබීම |
| 03. | සෞඛ්‍ය කම්කරු | 01 | 11,730-10x120-10x130-10 x 145 12 x 160-17,600 | අධ්‍යාපන සුදුසුකම් සලකා බලනු නොලැබේ |

*බඳවා ගැනීමේ ක්‍රමය* :- අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයකට භාජනය කොට සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව බඳවා ගැනීම කරනු ලැබේ.

*සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :*

1. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය ;
2. තෝරාගනු ලබන්නන් අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් වේ ;
3. පරිවාස කාලය තුලදී පැමිණීම, වැඩ, හැසිරීම, සතුටුදායක වන්නේ නම් පරිවාස කාලය අවසානයේ සේවයේ ස්ථිර කරනු ලැබේ ;
4. කර්මාන්ත පරිපාලක 11 තනතුර හා ආදායම් පරිපාලක 11 තනතුර සඳහා අයදුම් කරන අයදුම්කරුවන් ලිඛිත පරීක්ෂණයකින් සමත් විය යුතුය.
   ලිඛිත පරීක්ෂණය පැවැත්වෙන විෂයයන්
   (i) සාමාන්‍ය බුද්ධි පරීක්ෂණය පැය 1 1/2 යි.
   (ii) සාමාන්‍ය දැනුම පරීක්ෂණය පැය 1 යි.

*පොදු කොන්දේසි*

1. අයදුම්කරුවන් ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතුය.
2. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ අවුරුදු 45ට නොවැඩි විය යුතුය. (රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර සේවකයෙකු සම්බන්ධයෙන් උපරිම වයස් සීමාව බල නොපැවැත්වේ.)
3. අයදුම්කරු අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 03ක කාලයක් බස්නාහිර පළාත තුල ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය
4. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු කරනු ලැබූවෙකු නොවිය යුතුය.
5. විශිෂ්ට චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතුය
6. වත්තල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල පදිංචි සහ දැනට මෙම ප්‍රාදේශීය සභාවේ අනියම්/තාවකාලික/ආදේශක/කොන්ත්‍රාත් පදනම මත හෝ ව්‍යාපෘතියක් යටතේ සේවයේ යෙදී සිටින සේවකයින් කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

*අයදුම්පත් සමග එවිය යුතු සහතික පිටපත් :*

1. උප්පැන්න සහතිකය.
2. අධ්‍යාපන සහතික.
3. ප්‍රාදේශීය ලේකම්ගේ අනු අත්සන සහිතව ග්‍රාම නිලධාරි විසින් නිකුත් කළ පදිංචිය පිළිබඳ සහතිකය.
4. මෑතක දී ලබාගත් චරිත සහතික 02ක් (එක් සහතිකයක් ප්‍රදේශයේ ග්‍රාම නිලධාරීගෙන් ලබාගත් එකක් විය යුතුය.)
5. වෙනත් සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳ සහතික.

*අයදුම්පත් එවිය යුතු ආකාරය :*

1. මෙම නිවේදනයේ දැක්වෙන ආදර්ශ අයදුම්පත්‍රය අනුව අඟල් 12 x 8 ප්‍රමාණයේ තමා විසින් පිළියෙල කරගත් අයදුම්පත් 2011.08.05 වැනි දිනට හෝ ඊට පෙර "ලේකම් වත්තල ප්‍රාදේශීය සභාව, වෙළඳ සංකීර්ණය, කෙරවලපිටිය හැඳල, වත්තල" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.
2. අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අදාළ තනතුර සඳහන් කළ යුතුය.
3. දැනටමත් රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන්ගේ අයදුම්පත් තම ආයතන ප්‍රධානියාගේ නිර්දේශයෙන් එවිය යුතුය.
4. අතින් ගෙනැවිත් දෙන අයදුම්පත් භාරගනු නොලබන අතර ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

*සැලකිය යුතුයි :*

මෙම අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුර කාලසීමාවේ දී මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම, වෙනස් කිරීම, මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීම වත්තල ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

ඉහත සඳහන් අවම සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

එච්. එස්. අමරවංශ පෙරේරා,
ලේකම්,
වත්තල ප්‍රාදේශීය සභාව.

2011ක් වූ ජූලි මස 06 වැනි දින,
වත්තල ප්‍රාදේශීය සභාවේ දී ය.

ආදර්ශ අයදුම්පත

**වත්තල ප්‍රාදේශීය සභාව**

**.................................................................. තනතුර සඳහා වූ අයදුම්පත්‍රය**

1. *(අ)* මුලකුරු සමග නම :——————.
   *(ආ)* මුලකුරු වලින් හැඳින්වෙන නම් :——————.
2. පෞද්ගලික ලිපිනය :——————.
3. උපන් දිනය :
   වර්ෂය :——————. මාසය:——————. දිනය:——————.
4. බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිය අවුරුදු ——————.
5. *(අ)* ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක්ද?:——————.
   *(ආ)* එසේ නම් පරම්පරාවෙන් ද ? ලියාපදිංචියෙන් ද?:——————.
6. ස්ත්‍රී/පුරුෂ භාවය :——————.
7. විවාහක/අවිවාහක බව :——————.
8. අධ්‍යාපන සුදුසුකම්/සමත් වී ඇති ඉහලම විභාගය :——————.
9. වෘත්තීය සුදුසුකම්:——————.
10. උසාවියක් මගින් ඔබට දඬුවම් පවරා තිබේ ද?:——————.
11. එසේ නම් දඬුවමේ ස්වභාවය:——————.
12. දැනට ප්‍රාදේශීය සභාවේ සේවයේ යෙදී සිටින්නේ නම් ඒ පිළිබඳ විස්තර:——————.

මෙම ඉල්ලුම් පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය වූත් නිවැරදි වූත් ඒවා බව සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු අසත්‍ය හෝ වැරදි බව අනාවරණය වුවහොත් මෙම තනතුරට මා තෝරා ගැනීමට නුසුදුස්සෙකු බවට පත්වන බවත් තෝරා ගැනීමෙන් පසු දැනගතහොත් වන්දියක් නොගෙවා සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් මම දනිමි.

————————,
අයදුම්කරුගේ අත්සන.

දිනය:——————.

දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය

මෙම ඉල්ලුම්කරු වන ..........................................මහතා/මහත්මිය දැනට මෙම දෙපාර්තමේන්තුවේ/ආයතනයේ .......................................... වශයෙන් සේවය කරයි. ඔහු/ඇය සේවයෙන් මුදාහල හැක./නොහැක. ඔහු මොනයම් ආකාරයේ හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීමක් හැර) භාජනය වී නොමැති බව මෙයින් සහතික කරන අතර අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

————————,
ආයතන ප්‍රධානියාගේ අත්සන.
(නිල මුද්‍රාව තබන්න).

දිනය :——————.

07-642

# පළාත් පාලන නිවේදන

## පාතදුම්බර ප්‍රාදේශීය සභාව

2011 වර්ෂය සඳහා ගවමස්, එළුමස් වෙළඳසල් පවත්වාගෙන යාම වෙනුවෙන් බලපත්‍ර නිකුත් කිරීම

මෙහි පහත උපලේඛනයේ සඳහන් අය විසින් ඒ ඒ ස්ථානයන්හි ගවමස්, එළුමස් වෙළඳාම් කරගෙන යාම සඳහා බලපත්‍ර ලබාගැනීමට ඉදිරිපත්ව සිටින බව ගෝඝාතක ආඥාපනතේ 272 වැනි අධිකාරය 7(2) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

මෙම බලපත්‍ර නිකුත් කිරීම පිළිබඳව පාතදුම්බර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල පදිංචි යම් අයෙකු විරුද්ධ නම් ඔහු හෝ ඇය විරුද්ධ වන්නේ කුමන කරුණක් නිසා ද යන වග සඳහන් ලියවිල්ලක් පිටපත් දෙකකින් යුක්තව මෙම දැන්වීම *ගැසට්* පත්‍රයේ පළ වූ දින සිට දින දහහතරක් (14) ඇතුළත මා වෙත ඉදිරිපත් කළ යුතු බව මෙයින් දන්වමි.

මෙම කාලසීමාව තුල මෙම නිවේදනය පිළිබඳ යම් විරුද්ධත්වයක් ඉදිරිපත් නොවුනහොත් මෙහි උපලේඛනයේ සඳහන් ඉල්ලුම්කරුවන් වෙත අදාල ව්‍යාපාර ස්ථානවල වෙළඳාම කරගෙන යාම සඳහා 2011.01.01 දින සිට 2011.12.31 වැනි දින දක්වා බලපත්‍ර ලබාදීම කරන බව පොදු මහජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

ඩබ්. එම්. එස්. එස්. බී. වෙලගෙදර,
සභාපති,
පාතදුම්බර ප්‍රාදේශීය සභාව.

2011 ජූලි මස 11 වැනි දින,
පාතදුම්බර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

### උපලේඛනය

| | *ඉල්ලුම්කරුගේ නම* | *වෙළඳාම් කරන ස්ථානය* | *වෙළඳාමේ ස්වභාවය* |
|---|---|---|---|
| 1. | එස්. ජී. හුසේන් මයා. | අංක 437, දොරගමුව පාර, ගලදෙනිය හන්දිය, උඩතලවින්න | ගවමස් |
| 2. | කේ. එම්. තයියුබ් මයා. | අංක 40/ඒ, ඌරාදෙණිය, ගුන්නෑපාන | ගවමස් |
| 3. | එස්. එම්. රාසික් මයා. | අංක 342, දොරගමුව පාර, උඩතලවින්න | ගවමස් |
| 4. | එස්. එම්. ඉල්ලියාස් මයා. | අංක 357, දොරගමුව පාර, උඩතලවින්න | ගවමස් |
| 5. | බී. එම්. නසීම් මයා. | අංක 29, බංගලාගෙදර, මඩවල | ගවමස් |
| 6. | එස්. එම්. රවුෆ්දීන් මයා. | අංක 187, දොරගමුව පාර, වත්තේගෙදර, පොල්ගොල්ල | ගවමස් |
| 7. | අයි. එම්. යෙහිසාන් මයා. | අංක 13/සී, කටුගස්තොට පාර, මඩවල | එළුමස් |

07-753/2

---

## පාතදුම්බර ප්‍රාදේශීය සභාව

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත (272 වැනි අධිකාරය) යටතේ දැන්වීම

මෙහි පහත සඳහන් අය විසින් උපලේඛනයේ සඳහන් කර ඇති ස්ථානයේ 2011 වර්ෂයට ගෝඝාතකාගාරයක් හා එළු ඝාතකාගාරයක් පවත්වාගෙන යාම සඳහා බලපත්‍ර ඉල්ලමින් අයදුම්පත් මා වෙත ඉදිරිපත් කර ඇති බවත්, එම බලපත්‍ර නිකුත් කිරීම පිළිබඳව පාතදුම්බර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල පදිංචි හෝ ජීවත්වන අයෙක් හෝ අයවළුන් විරුද්ධ වන්නේ නම් ඔහු හෝ ඇය එසේ විරුද්ධ වන්නේ කුමන හේතූන් පදනම් කරගෙන ද යන්න පිළිබඳව විස්තර ලිඛිතව පිටපත් දෙකකින් යුක්තව මෙම දැන්වීම *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* (ආ) කොටසේ පළවූ දා සිට දින 14ක් ඇතුලත මා වෙත දන්වා එවිය යුතු බව මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ 272 වැනි අධිකාරය 7(2) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඩබ්. එම්. එස්. එස්. බී. වෙලගෙදර,
සභාපති,
පාතදුම්බර ප්‍රාදේශීය සභාව.

2011 ජූලි මස 11 වැනි දින,
පාතදුම්බර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

### උපලේඛනය

| | *ඉල්ලුම්කරුගේ නම* | *ස්වභාවය* | *ගෝඝාතකාගාරය හා එළු ඝාතකාගාරය පවත්වාගෙන යන ස්ථානය* |
|---|---|---|---|
| 1. | අයි. එම්. යෙහිසාන් මයා,<br>අංක 15/6, නුවර පාර, මඩවල, කඩවීදිය | *ගෝඝාතකාගාරය* | අංක 11/6, නුවර පාර, මඩවල |
| 2. | කේ. එම්. තයියුබ් මයා,<br>අංක 31/4, නුගදෙනිය, ගුන්නෑපාන | *ගෝඝාතකාගාරය* | අංක 31/4, ඌරාදෙනිය, ගුන්නෑපාන |
| 3. | අයි. එම්. යෙහිසාන් මයා,<br>අංක 6/15, නුවර පාර, මඩවල, කඩවීදිය | එළුඝාතකාගාරය | අංක 15/6, නුවර පාර , මඩවල |

07-753/1

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.